# විසර්ජන ශීර්ෂය 171 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

### උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 214 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.23,844,700,000ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.20,886,307,364ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.1,412,737,166 ත් රු.1,545,655,470ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 42 ත් සියයට 7.5 අතර පරාසයක පැවැතින. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 171 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 922,000,000 | 2,425,200,000 | 721,972,509 | 1,212,490,325 | 200,027,491 | 1,212,709,675 |
| 214 | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | 14,719,000,000 | 5,778,500,000 | 14,611,003,000 | 4,340,841,530 | 107,997,000 | 1,437,658,470 |
| | **එකතුව** | 15,641,000,000 | 8,203,700,000 | 15,332,975,509 | 5,553,331,855 | 308,024,491 | 2,650,368,145 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 171 | 17101 | 4,500,000 | 3,543,610 | 2,300,000 | 2,605,076 | 18,000,000 | 13,239,901 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.102,915,127 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |

| | | |
|---|---|---|
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | 6000/0000/00/0015/0018 | 102,915,127 |

## 11 කොටස

### එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

1. **විසර්ජන ශීර්ෂය 171- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

1.1 **විගණන විෂය පථය**

උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 14 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් පකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

1.3 **විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ)** අයවැය විචලනය

(i) වැය විෂයයන් 14 ක් සඳහා සලසා තිබුණු රු. 443,681,673 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 09 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැයවිෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 99 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) වීරමොන් පර්පාටිය අනුගමනය කරමින් වියදම් ශීර්ෂය යටතේ වූ පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 16 කට මුල් ප්‍රතිපාදන සියයට 50 සිට සියයට 2973 දක්වා වූ වැඩි කිරීමද වැය විෂයයන් 06 ක මුල් ප්‍රතිපාදන සියයට 20 සිට සියයට 42 දක්වා වූ අඩුකිරීම්ද කර තිබණි.

**(ආ)** රාජ්‍ය වියදම් කළමණාකරණය

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික ඇස්තමේන්තු මඟින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ඇස්තමේන්තුවලින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් පුනරාවර්තන හා මූලධන වියදම්වලින් පිළිවෙලින් සියයට දෙකක් හා සියයට නවයක ප්‍රතිපාදන ඉතිරිකල යුතු වුවත් අමාත්‍යාංශය විසින් එසේ ප්‍රතිපාදන ඉතිරිකර නොතිබුණි.

(ඇ) පොදු තැන්පත් ගිණුම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නවක සිසුන්ගේ නායකත්ව පුහුණුව හා ධනාත්මක චින්තන වැඩසටහන සඳහා වර්ෂය තුලදී අමාත්‍යාංශයට ලබාදුන් රුපියල් මිලියන 204.6 ක මුදලින් ඉතිරි වී තිබුණු මුදල වූ රුපියල් මිලියන 62.8 ක් 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

i. විෂය අංක 17101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.323,007 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

ii. 2012 ඔක්තෝබර් 01 දින සිට වැටුප් රහිත විදේශ නිවාඩු ලබා ඇති ගණකාධිකාරීවරයාගේ රු.752,434 ක ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මෙම මුදල සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් ගිණුමේ සේවා නියුක්ත නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය තුළම පෙන්නුම් කර තිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත් එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියල කර නොතිබුණි. පිළියෙල කර තිබුණේ 2013 ජුලි 03 වන දිනදීය.

### 1.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 1.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත අමාත්‍යාංශය විසින් පිළියෙල කල යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මාස 09 කට පමණක් අදාලවූ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණි.

### 1.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. එය පිළියෙල කර තිබුණේ 2013 ජනවාරි 28 දින දීය.

## 1.5 වත්කම් කළමනාකරණය

### 1.5.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 31 දිනට පථම සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2013 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 1.5.2 පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම.

2011 පෙබරවාරි මාසයේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය වෙතින් ලබා ගන්නා ලද වාහනය අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.5.3 බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු බැරකම් රු.31,942,593 ක් විය.

## 1.6 අනුකූල නොවීම්

**නීති,රීති , රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ). <u>මුදල් රෙගුලාසි</u> | | |
| i. මු.රෙ 94 | 10,206,792 | යම් ආයතනයක් විසින් දරන ලද වැය ප්‍රමාණය සහ දරන ලද බැරකම් ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදනය නොඉක්ම විය යුතු වුවත් වැය විෂයයන් 19 කට අදාලව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට එළඹ තිබුණි. |
| ii. මු.රෙ104 | | වාහන අලාභහානි විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| iii. | මු.රෙ 1645 (ආ) | | 268 පොදු ආකෘතිය අනුව දෛනික ධාවන සටහන් අධීක්ෂණ නිළධාරීන් ලවා නිතිපතා පරීක්ෂා කරවාගෙන නොතිබුණි. |
| (ආ) | 1997 ජනවාරි 24 දිනැති අංක 116 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 116 ට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සේවකයන් තිදෙනෙකුද, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අනියම් සේවකයින් තිදෙනෙකුද, 21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ සේවකයන් පහලොස් දෙනෙකුද, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු සඳහා යොදවාගෙන තිබුණි. |
| (ඇ) | 2011 පෙබරවාරි 21 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 449 (ඇ) | 414,500 | හදිසි සේවා සැපයීම වෙනුවෙන් ගාස්තු ගෙවීමේ පදනම මත බඳවාගත් නිළධාරීන් හතර දෙනෙකු සඳහා ගෙවීම් කිරීමට අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 1.7 ව්‍යාපෘත ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### 1.7.1 විසිඑක් වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය

විසිඑක් වන සියවස සඳහා වු උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ ණය ගිවිසුම ප්‍රකාර ඇස්තමේන්තුගත මුළු පිරිවැය එක්සත් ජනපද ඩොලර් මිලියන 40 කි. ජාත්‍යන්තර සංවර්ධන සංගමය මගින් මෙම මුදල මූල්‍යයනය කෙරේ. එහි සංරචක හතරකි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 නොවැම්බර් 01 දින ආරම්භ කල අතර 2015 දෙසැම්බර් 31 දින නිමකිරීමට නියමිතය. විගණනයේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) මූල්‍ය කාර්ය සාධනය

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.655,634,292 ක් වූ අතර , 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.906,222,843 ක් විය.

#### (ආ) ආර්ථික නොවූ ගණුදෙනු

2012 වර්ෂය තුළ වාහන දෙකක් කුලියට ගැනීම වෙනුවෙන් කුලී ගාස්තු ලෙස රු.1,320,000 ක මුදලක් ගෙවා තිබුණද, ව්‍යාපෘති කාර්යයන් සඳහා එම වාහන උපයෝජනය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) විගණනය සඳහා සාක්ෂි නොවීම.**

2012 වර්ෂය සඳහා ව්‍යාපෘති වාහනවල ඉන්ධන වියදම ලෙස රු.2,891,547 ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම වාහන ධාවනය පිළිබඳ ධාවන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) නීති,රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. නිකුත් කරන ලද නමුත්, මාස 06 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් 05 ක එකතුව වූ රු.180,000 ක් මුදල් රෙගුලාසි 396 (ඈ) ප්‍රකාරව ආදායමට ගෙන නොතිබුණි.

ii. ලෝක බැංකු ලිඛිත අනුමැතියකින් තොරව 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 4.2.1 හා 4.2.4 වගන්තිවලට පටහැනිව නලධාරීන් 05 දෙනෙකුගේ වැටුප් අදාළ වැටුප් තලයේ තබනු වෙනුවට උපරිම වැටුප් තලයේ තබා තිබුණු අතර, මසකට රු.40,000 බැගින් වැඩිපුර ගෙවා තිබුණි.

**(ඉ) අරමුදල් උපයෝජනය**

මුල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ සංරචක අනුව කාර්යසාධනය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| විස්තරය | අනුමත ප්‍රතිපාදන | 2012 දෙසැම්බර් 31 දිනට තත්‍ය වියදම | උපයෝජනය අනුමත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| | රු. | රු. | % |
| උසස් අධ්‍යාපන අංශය සඳහා ජාතික උසස් අධ්‍යාපන සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීම. | 6,500,000 | 762,288 | 12 |
| සමස්ථ උසස් අධ්‍යාපන අංශය සඳහා තත්ත්ව සහතික යාන්ත්‍රණ පිහිටු වීම. | 21,000,000 | 9,551,965 | 45 |
| **එකතුව - 1 සංරචක** | **27,500,000** | **10,314,253** | **38** |
| විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන (UDG) | 200,000,000 | 206,152,021 | 103 |
| තත්ත්ව සහ නවෝත්පාදන ප්‍රදාන (QIG) | 12,000,000 | 9,513,189 | 79 |
| **එකතුව - 2 සංරචකය** | **212,000,000** | **215,665,210** | **102** |

| | | | |
|---|---|---|---|
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණික ආයතන වැඩ සටහන් නවීකරණය සහ කළමනාකරණය | 20,000,000 | 9,380,984 | 47 |
| උසස් තාක්ෂණික අධ්‍යාපනයට ප්‍රවේශවීමේ ප්‍රාදේශිය සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම. | 217,900,000 | 178,452,093 | 82 |
| **එකතුව - 3 සංරචකය** | **237,900,000** | **187,833,077** | **79** |
| අධ්‍යයන, කළමනාකාර්ත්ව සහ තාක්ෂණික කාර්යමණ්ඩලයන්හි මානව සම්පත් සංවර්ධනය | 117,100,000 | 115,469,828 | 99 |
| ප්‍රතිපත්ති අධ්‍යයන, පර්යේෂණ, මෙහෙයවීම, ඇගයීම, සම්බන්ධීකරණය සහ සන්නිවේදනය | 155,500,000 | 126,351,924 | 81 |
| **එකතුව - 4 සංරචකය** | **272,600,000** | **241,821,752** | **89** |
| **මුළු එකතුව** | **750,000,000** | **655,634,292** | **87** |

(ඊ) **ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය**

සංරචක අනුව ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය පහත දැක්වේ.

I. **උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීම.**

උසස් අධ්‍යාපන අංශය සඳහා වූ නියමයන් ආයතනගත කිරීම යටතේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන අංශය සඳහා ජාතික සුදුසුකම් රාමුවක් සංවර්ධනය කිරීම සහ ආයතනික රාමුව පිළිබඳ තත්ත්ව සහතික ක්‍රමයක් ස්ථාපිත කිරීම 2012 වර්ෂය අවසාන වන විට සම්පූර්ණ කළ යුතුවුවද උසස් අධ්‍යාපන ආයතන තුළ ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට 2012 වර්ෂය අවසානය තෙක් කටයුතු කර නොතිබුණි.

II. **ඉගැන්වීමේ හා ඉගෙනීමේ තත්ත්වය ප්‍රවර්ධනය කරීම.**

(i) **විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන**

විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන ආර්ථිකයට උචිත උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීම පිණිස සියළු විශ්වවිද්‍යාලවල විශේෂයෙන් මුලික වැදගත්කමක් ලෙස ව්‍යාපෘතිය විසින් හඳුනාගන්නා ලද ක්ෂේත්‍ර සඳහා සහායවේ.
ව්‍යාපෘතිය සහාය සලසනුයේ,

- ශිෂ්‍යයින්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතාවය වර්ධනය කිරීමට
- තොරතුරු තාක්ෂණ නිපුණතා වර්ධනය කිරීමට
- උපාධි අපේක්ෂකයින්ගේ මෘදු නිපුණතා සංවර්ධන කිරීමට
- ජනවාර්ගික සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීමට

ව්‍යාපෘතියේ සමස්ථ සැලැස්මට අනුව, වර්ෂ 03 ක් ඇතුළත ඉහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා එක් එක් විශ්වවිද්‍යාලයට ප්‍රතිපාදන වෙන්කර තිබුණි. පළමු වර්ෂ දෙක සඳහා සලසන ලද ප්‍රතිපාදනයෙන් 2012 වර්ෂය අවසානය දක්වා ප්‍රතිපාදන උපයෝජනය සියයට 0 සිට සියයට 54 ක පරාසයක පැවතුණි. සංරචක අනුව මූල්‍ය ප්‍රගතිය දක්වා ඇතත් භෞතික ප්‍රගතිය අදාල වාර්තාවල දක්වා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| විශ්වවිද්‍යාලය | ප්‍රතිපාදනය<br>රු. | තථ්‍ය වියදම<br>රු. | උපයෝජනයේ ප්‍රතිශතය<br>% |
|---|---|---|---|
| කොළඹ | 73,870,000 | 30,194,362 | 41 |
| නැගෙනහිර | 37,280,000 | 1,129,721 | 3 |
| ගම්පහ වික්‍රමආරච්චි | 2,969,000 | 1,038,936 | 35 |
| දේශීය වෛද්‍ය ආයතනය | 5,534,000 | 199,000 | 4 |
| යාපනය | 67,229,500 | 1,085,878 | 2 |
| ශ්‍රී ජයවර්ධනපුර | 83,042,000 | 898,760 | 1 |
| කැලණිය | 65,130,000 | 31,496,587 | 48 |
| මොරටුව | 38,100,000 | 10,457,363 | 27 |
| විවෘත | 31,333,000 | 5,583,344 | 18 |
| පේරාදෙණිය | 80,556,000 | 137,000 | 0.2 |
| රුහුණ | 56,490,000 | 10,447,915 | 18 |
| රජරට | 46,300,000 | 5,733,120 | 12 |
| සබරගමුව | 27,539,500 | නැත | 0 |
| අග්නිදිග | 22,405,000 | 10,303,367 | 46 |
| ස්වාමි විපුලානන්ද ආයතනය | 9,000,000 | 230,986 | 3 |
| ඌව වෙල්ලස්ස | 14,075,000 | 3,127,347 | 22 |
| දෘශ්‍ය හා ප්‍රසාංගික කලා | 23,720,200 | 6,231,753 | 26 |
| වයඹ | 19,146,000 | 10,337,337 | 54 |

**(ii) තත්ත්ව සහ නවෝත්පාදන ප්‍රදාන**

තත්ත්ව සහ නවෝත්පාදන ප්‍රදාන මගින් විශ්වවිද්‍යාල වල ක්‍රමෝපාය අධ්‍යයන වැඩසටහන්වලට සහාය වන අතර උපාධිධාරීන්ගෙ සේවා යෝජනීයත්වය සහ තාක්ෂණික වාණිජකරණ කාර්යාල හා ව්‍යාපාර මධ්‍යස්ථාන ආදියෙහි විශ්වවිද්‍යාල සම්බන්ධතාවයන් ශක්තිමත්කිරීමේ කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ප්‍රතිපාදන අදියර 04 ක් යටතේ විෂයමාලා ප්‍රතිසංස්කරණ, ඉගැන්වීම් නවීකරණය, ඉගෙනීමේ හා තක්සේරු කිරීමේ ක්‍රම, නවෝත්පාදන

කටයුතු ආදී කාර්යයන් සිදුකිරීම සඳහා උපයෝජනය කිරීමට සැලසුම්කර තිබුණු අතර මෙම කාර්යයන් සඳහා කොළඹ, කැලණිය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලවලට පළමු වර්ෂ 02 තුළදී සලසන ලද ප්‍රතිපාදනයෙන් 2012 වර්ෂය අවසාන වන විට උපයෝජනය සියයට 01 සිට සියයට 15 ක පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| විශ්වවිද්‍යාලය | පීඨය | ප්‍රතිපාදනය රු. | තථ්‍ය වියදම රු. | උපයෝජනයේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|
| කොළඹ | අධ්‍යාපන | 19,868,660 | 160,000 | 1 |
| | වෛද්‍ය | 23,835,500 | 189,398 | 1 |
| | විද්‍යා | 21,949,000 | 1,375,000 | 6 |
| කැලණිය | මානව අධ්‍යයන | 22,728,500 | 576,710 | 3 |
| | විද්‍යා | 24,592,000 | 1,408,535 | 6 |
| පේරාදෙණිය | කෘෂිකර්මය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 22,096,000 | 3,375,651 | 15 |
| | විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය | 22,506,500 | 2,427,894 | 11 |

## III. ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය නවීකරණය කිරීම.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය යටතේ ක්‍රියාත්මක වන ආයතන නවීකරණය කිරීමේ අරමුණින් විසිඑක්වන සියවස සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය මගින් නවීකරණය වැඩසටහනක් ඉදිරිපත්කරන ලදී. මේ පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා උසස තාක්ෂණික අධ්‍යාපන ආයතනය සංවර්ධනය කිරීම සඳහා නායකත්ව සහ තත්ත්ව සංවර්ධන මධ්‍යසථානයක් ( Leadership and Quality Development Centre - LQDC ) සථාපිත කිරීමට ව්‍යාපෘතිය සැලසම්කර තිබණද,එහ කටයුතු 2013 මැයි 31 දක්වා ආරම්භකර නොතිබුණි.

(ii) 2012 නොවැම්බර් මාසයෙදී රත්නපුර උසස තාක්ෂණික ආයතනයෙ ඉදිකිරීම් වැඩ නිම කිරීමට සැලසම්කර තිබණද,2012 ජනවාර් 22 දිනැති ව්‍යාපෘති අධ්‍යක්ෂකගේ ලිපියට අනුව,කාලපරිච්ඡේදය 2013 ජනවාර් 29 දක්වා දීර්ඝ කර තිබණි.කෙසෙවවද, 2013 මැය 31 දක්වා මෙම ගොඩනැගිල්ල නිමකර ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයට භාර දී නොතිබුණි.

(iii) වවුනියා උසස තාක්ෂණික ආයතනයෙ ඉදිකිරීම් වැඩ 2013 ජනවාරි මාසයෙදී නිම කිරීමට සැලසම්කර තිබණි.කෙසෙවුවද,කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදී ඉදිකිරීම් කාලපරිච්ජේදය 2013 මාර්තු 31 දක්වා දීර්ඝ කර තිබුණද,2013 මැයි 31 දක්වා ඉදිකිරීම් වැඩ නිම කර ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයට භාරදී නොතිබුණි.

**IV. මානව සම්පත් සංවර්ධනය,මෙහෙයවීම හා ඇගයීම,අධ්‍යයන හා සන්නිවේදනය**

-------------------------------------------------------------------------------------

(i) මෙම සංරචකයේ ඉලක්කය වූ උසස් අධ්‍යාපන අංශයේ සංවිධානමය ධාරිතාවය හා මානව සම්පත් ශක්තිමත් කිරීම සහ අධීක්ෂණය හා ඇගයීම,ප්‍රතිපත්ති විශ්ලේෂණය හා ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා රු.143,839,576 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට රු.90,549,493 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ii) ව්‍යාපෘතිය විසන් කරන ලද පශ්චාත් උපාධි සඳහා ප්‍රදානවලින් 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලවල සහ උසස තාක්ෂණික ආයතනවල ප්‍රගතිය පිළවෙලින් සියයට 88 ක් හා සියයට 22 ක් විය.
විස්තර පහත දැක්වේ.

| ආයතනය | ඇස්තමේන්තුගත ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රදානයන් සපයනු ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ප්‍රගතිය සියයට |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල | 149 | 131 | 88 |
| ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන | 100 | 22 | 22 |

### 1.7.2 <u>තාක්ෂණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා වූ ව්‍යාපෘතිය</u>

තාක්ෂණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා වූ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ මට්ටක්කුලිය සහ ලබුදූව උසස් තාක්ෂණ ආයතනයන්හි තාක්ෂණ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා යාවත්කාලීන කිරීම වේ. ණය ගිවිසුම් අනුව ව්‍යාපෘතිය සඳහා ණය වශයෙන් ඕස්ට්‍රියා රජයෙන් යූරෝ 11,000,000 ක් ද නෙදර්ලන්ත රජයෙන් යූරෝ 8,175,022 ක් ද සැපයීමට එකඟ වී තිබුණි. ඊට අමතරව ප්‍රදාන වශයෙන් නෙදර්ලන්ත රජය යූරෝ

2,724,978 ක අරමුදල් සැපයීමට එකඟ වී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මුළු ණය හා ප්‍රදාන වටිනාකම යූරෝ මිලියන 21.9 ක් වේ.

ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය 2008 දෙසැම්බර් ආරම්භකර 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වුවද 2011 මූල්‍ය වාර්තා හා ව්‍යාපෘති අවසන් වාර්තා 2013 ජූලි දක්වා විගණකාධිපති වෙත ලබාදී නොතිබුණි.

## 1.8 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමතසේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 16 | 08 |
| (ii) | තෘතියික මට්ටම | 02 | - | 02 |
| (iii) | ද්විතියක මට්ටම | 99 | 78 | 21 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 40 | 37 | 03 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 07 | 05 | 02 |
| | **උප එකතුව** | **172** | **136** | **36** |

## 2 විසර්ජන ශීර්ෂය 214 - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

### 2.1 විගණන විෂය පථය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි වූ නිරීක්ෂණය සහ පහත 2.4 සහ 2.5 ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) <u>අයවැය විචලනය</u>

2012 වර්ෂය තුළදී ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදිත මුදලින් සියයට 25 ක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි.

## 2.4 <u>යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය</u>

### 2.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පලාත් සභා ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතුවුවත් 2012-2015 සඳහා එම සැලැස්ම යාවත්කාලීනව සකස්කර නොතිබුණි.

### 2.4.2 වාර්ෂික වාර්තා

2003 ජූන 02 දිනැති අංක පිඊ/ඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2013 නොවැම්බර් 08 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට ව සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 49 | 41 | 08 |
| (ii) | ද්විතියක මට්ටම | 156 | 121 | 35 |
| (iii) | ප්‍රාථමික මට්ටම | 51 | 48 | 03 |
| | එකතුව | 256 | 210 | 46 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 46 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.